# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ආපදා කළමනාකරණ අංශය, 120/2, විද්‍යා මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව.
அனர்த்த முகாமைத்துவ பிரிவு, 120/2, வித்யா மாவதா, கொழும்பு 7, இலங்கை
Disaster Management Division, 120/2, Vidya Mawatha, Colombo 7, Sri Lanka. Tele: 011 266 5180, Fax: 011 266 5296, Website: www.defence.lk


මගේ අංකය / எனது இல / My No } MPBT/MODA/MINISTERS/05/-NI

දිනය / திகதி / Date } 2024 මැයි මස 15 වන දින

ගරු මහින්ද අමරවීර මැතිතුමා
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය,
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

හිතවත් අමාත්‍යතුමනි,

<u>දඹුල්ල ප්‍රදේශයේ ලොකු ළූණු වගාව සම්බන්ධවයි</u>

මා නියෝජනය කරන දඹුල්ල හා ලග්ගල ආසනයේ සමස්ත ලොකු ළූණු ගොවියන් මීට වසර ගණනාවක සිට ළූණු වගාව ඉතා සාර්ථක මට්ටමින් පවත්වාගෙන ගියද, පසුගිය කාල වකවානුවේදී මිල පහලයාම හේතුවෙන් ලොකු ළූණු වගාවෙන් ඉවත් වීමට කටයුතු කල අතර, ඒ හේතුවෙන් වෙළඳපලේ ලොකු ළූණු මිළ පාරිභෝගිකයාට දරාගත නොහැකි මට්ටම දක්වා වැඩි විය. මීට පිළියමක් ලෙස මෙම වසරේ ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් ලොකු ළූණු වගා කරුවන් දිරිමත් කර නැවත ඔහුන් වගා කටයුතු සඳහා පොළඹවා ගන්නා ලදි.

ඒ අනුව, මේ වන විට විශාල ගොවිබිම් ප්‍රමාණයක ලොකු ළූණු වගා කිරීමට කටයුතු සම්පාදනය කොට ඇත. නමුත් බරපතල කාරණාව නම් මේවන විට වෙළඳපලේ ලොකු ළූණු මිළ ඉතා සීඝ්‍රලෙස පහළ බැසීමයි. මෙම තත්වය තව දුරටත් පැවතියහොත් ඉදිරියෙදි ලොකු ළූණු ගොවින් තම අස්වැන්න නෙළීමේදි හා වෙළඳපලට යොමු කිරිමේදි ඔහුන්ට දැඩි අසාධාරණයක් සිදුවනු ඇත.

ලොකු ළූණු ගොවින් ආරක්ෂා කර ගැනිම සඳහා අවම වශයෙන් රු.250.00 ක මිළක්වත් පවත්වාගත යුතුව ඇත. ගොවිජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් මාගේ ඍජු මැදිහත්විම ඔවුන් අපේක්ෂා කරයි. විශේෂයෙන්ම දැනට පවතින තත්වය ඉදිරිටත් පැවතියහොත් දැඩි මිළ අස්ථාවර තත්වයකට පත්ව නැවතත් මාස කිහිපයකින් ලොකු ළූණු මිළ අදහාගත නොහැකි පරිදි වැඩිවනු බව නොවනුමානය. ඒ අනුව පාරිභෝගිකයාත් ගොවියත් ආරක්ෂා කිරිම අපගේ වගකීමකි.

මීට වසර ගණනාවක සිට ලොකු ළූණු ගොවියාගේ අස්වැන්න නෙළන අවදියේදි මාගේ පියාණන් වන ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මැතිතුමා විසින් මෙම කාලසීමාවේදි ආනයනික ලොකු ළූණු සඳහා බදු පැනවිමට අවශ්‍ය මැදිහත්විම සිදුකරන ලදි. ඒ අනුව මෙවරත් ආනයනික ලොකු ළූණු සඳහා බදු පැනවිමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි. ගොවි හදවත් හඳුනන ඔබතුමා මෙම ඉල්ලිම ඉටු කරනු ඇතැයි තරයේම විස්වාස කරන අතර, මෙය හුදෙක්ම ගොවිජනතාව මෙන්ම පාරිභෝගිකයාත් වෙනුවෙන් සිදු කරනු ලබන ඉල්ලීමක් සේ සලකනු මැනවි.

ඔබතුමාගේ කාරුණික දැනගැනිම පිණිස වර්ථමානයේ ලොකු ළූණු වල මිල ගණන් ඇමුණුමක් වශයෙන් මේ සමඟ අමුණා ඇත.

ස්තූතියි,
මෙයට - හිතවත්,

ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය


ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්
ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

ඇමුණුම 'අ'

| අනු අංකය | වර්ගය | කිලෝ එකක මිල |
|---|---|---|
| 1. | Turky | 20.00 |
| 2. | Burma | 165.00 |
| 3. | Chaina | 60.00 |
| 4. | Pakistan | 130.00 |
| 5. | Indian | 150.00 |